# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2447/04 - 2025 ජූලි මස 28 වැනි සඳුදා - 2025.07.28**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : RAT/LAN/10/FI/12.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවයේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ අංක 541, ගල්කිස්ස ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 521004/07/09 හා 2025/03/21 දිනැති කැඩැස්තර සිතියමේ කැබලි අංක 01 හා 02 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1063 ක් වූ ඉඩම් කැබලි 02 :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: ගල්කිස්ස වත්ත, වරිපනම් අංක 37/2, ශ්‍රී ධර්මපාල මාවත; ඉඩමේ විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: 1. සී. ඩී. කාසි චෙට්ටි, අංක 10 A, ඒලයිට් සී පෙදෙස, කොළඹ 08. 2. එන්. වයි. කාසි චෙට්ටි, අංක 11, අබේවික්‍රම මාවත, ගල්කිස්ස; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0532.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: ගල්කිස්ස වත්ත, වරිපනම් අංක 37/2, ශ්‍රී ධර්මපාල මාවත; ඉඩමේ විස්තරය : ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: 1. සී. ඩී. කාසි චෙට්ටි, අංක 10ඒ, ඒලයිට් සී පෙදෙස, කොළඹ 08. 2. එන්. වයි. කාසි චෙට්ටි, අංක 11, අබේවික්‍රම මාවත, ගල්කිස්ස; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0531.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 17 වැනි දින පෙ.ව. 10.30 ට රත්මලාන, ගාලු පාරේ අංක 175 දරන ස්ථානයේ පිහිටි ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 සැප්තැම්බර් මස 03 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. ඔප්පු සහ අනෙකුත් ලේඛන පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එම්. එම්. කේ. දිල්රුක්ෂි වල්පොල,
ප්‍රාදේශීය ලේකම්,
රත්මලාන.

2025 ජූලි මස 22 වැනි දින,
රත්මලාන ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ දී ය,

EOG 07 - 0324



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සංශෝධනයයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ඉහල ඌව සංවර්ධන වැඩසටහන අදියර 01 පස්සර පුහුල්වත්ත වැව ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2011/IR/189.
*ප්‍රාදේශීය ලේකම්ගේ අංකය* : BD/PS/LND/4/1/6-II.

2025.02.17 දින මා විසින් අංක 2424/04 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ* III කොටසේ ශුද්ධි පත්‍රිකාවේ ප්‍රසිද්ධ කරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීම අනුව 2025.03.21 දිනට යොදාගෙන තිබූ හිමිකම් පරීක්ෂණය 2025.08.29 දින පෙ. ව. 10.30ට පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩබ්. ටී. ගංගානි සෝමවීර,
ප්‍රාදේශීය ලේකම්,
පස්සර.

2025 ජූලි මස 22 වැනි දින,
පස්සර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

EOG 07 - 0325

ශුද්ධි පත්‍රයයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MO/ED/03/ACQ/20.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4/3/4/2014/LO/431.

මොනරාගල පොලිස් අධිකාරි කාර්යාලය සඳහා රජයට අත් කර ගත් ඉඩම් වෙනුවෙන් පළ කරන ලද 2019.09.24 හා 2142/13 අංක දරන ගැසට් නිවේදනයේ 7 වන වගන්තිය යටතේ මොනරාගල මැනුම් අධිකාරි විසින් පිළියෙළ කර ඇති අ.ග.පි. අංක 172, අතිරේක අංකය 405 පත්‍ර අංක 450 හි දැක්වෙන ඉඩම් යන්නෙහි අතිරේක අංකය 409 ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඩබ්ලිව්. ඩී. පී. සී. සමරසේකර,
ප්‍රාදේශීය ලේකම්,
මොනරාගල.

2025 ජූලි මස 22 වැනි දින,
මොනරාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය,

EOG 07 - 0326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.